[ගරු විජයදාස රාජපක්ෂ මහතා]

Thereafter, in the 17th Century, Italian astronomer and philosopher, Galileo Galilei, the father of Modern Science, was convicted for discovering the Heliocentric Theory. Although, the teaching in that era was that the sun was rotating around the earth, he discovered that it was otherwise. Such a discovery in astronomy was considered an offence deserving capital punishment.

In human history, the most aggrieved victim was nobody else other than Jesus Christ, who was denied a fair trial. The only offence allegedly committed by him was that he has said at the Last Supper that he was above the King. Judas who was one among the 13 at the Last Supper betrayed Jesus Christ and King Herod wanted to kill him on those charges alone.

Although Pontius Pilate found that Jesus Christ was not guilty, but due to the influence of the King and the priests, he was crucified while saving the thief Barabbas, who had been, in fact, convicted for crimes. This amply demonstrates that throughout in human history, those who deserved to have fair trials were given it very rarely. That shows politics of those in the highest echelons, could, at times be stupid.

We do not know, in this drama, who the Judas is behind the Chief Justice. But, the fact remains that what has happened today will be written as history tomorrow. Knowing as we are of those happenings, the fate that might befall the Chief Justice, Dr. (Mrs.) Bandaranayake, cannot spring a surprise to us.

There is a saying: "Advice is least heeded when it is most needed". Especially, people with power are tempted not to heed any good advice, as they are excessively intoxicated with power. At this juncture, let us not forget what Abraham Lincoln said. I quote:

> "Let every man remember that to violate the law is to trample on the blood of his father and to tear that charter of his own and his children's liberty."

At last, please do not forget what Mahatma Ghandi, in his wisdom, referring to justice said. I quote:

> "There is a higher court than courts of justice and that is the court of conscience. It supersedes all other courts."

We are shocked and dismayed by the disastrous consequences that would befall our people by this array of events. However, viewed from a political dimension, the Opposition is not that bewildered, because we are certain that this coalition Government is now expediting its inevitable downfall by this ludicrous tendency to debilitate the Judiciary.

Thank you.

[අ. භා. 4.20]

ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දෝෂාභියෝග යෝජනාව පාර්ලිමේන්තුවේ විවාදයට ගන්නා මේ වෙලාවේ මට ලැබී තිබෙන ඉතාම සීමිත කාලය තුළ වැදගත් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකය නිර්මාණය වීම පිළිබඳව කිතුනු බැතිමතුන් දරන විශ්වාසය අනුව, ආදම් සහ ඒව මැවීම පිළිබඳ කතන්දරය අප දන්නවා. කිතුනු විශ්වාසය අනුව දෙවියන් වහන්සේ ආදම් පළමු කොටම මවනවා. ඊළඟට, ආදම්ගේ සහායට ආදම්ගේ ඉල ඇටයක් ගෙන ඒව මවනවා. පස්සේ මේ දෙදෙනාම තහනම් ගහේ ගෙඩි කෑ නිසා දඬුවමකුත් ලබනවා කියා කිතුනුවන්ගේ විශ්වාසයක් තිබෙනවා. අපේ ගරු ජයලත් ජයවර්ධන මැතිතුමා ඒ ගැන දන්නවා ඇති. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආදම්ගේ ඉල ඇටයකින් තමයි ඒව නිර්මාණය කළේ. ගරු ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමනි, ටික කාලයක් ගිහිල්ලා ඒව කිව්වොත්, "මගේ ඉල ඇටයකින් තමයි ආදම් නිර්මාණය වුණේ" කියලා, ලෝකය බිහි වීම පිළිබඳ කිතුනු විශ්වාසය සම්පූර්ණයෙන් කණපිට හැරෙනවා. අධිකරණය කියන්නේ, ආදම්ගේ ඉල ඇටයකින් හැදුණු ඒව වාගේ පාර්ලිමේන්තුව හරහා නිර්මාණය වූ දෙයක් මිසක්, පාර්ලිමේන්තුව වාගේ මහ ජනතාවගේ පරමාධිපත්‍ය බලයෙන් සෘජුවම නිර්මාණය වූ දෙයක් නොවෙයි. ආදම් බිහි වුණේ නැත්නම් ඒව නැහැ. ආදම් බිහි වූ නිසා තමයි ඒ ඉල ඇටයෙන් ඒව හැදුණේ. දැන් මේ සභාවේ ඉන්න විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අපට කියනවා, කරුණාකර මේ සභාව -මේ පාර්ලිමේන්තුව- ඊට උඩින් බලසම්පන්න ආයතනයක් හැටියට අධිකරණය පිළිගෙන මේ පාර්ලිමේන්තුවේ බලතල වළක්වන්න අධිකරණය ගන්නා නියෝග පිළිගන්න කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳ තර්ක ගොඩක් මේ ගරු සභාවේ මතු වුණා. තවත් ඉතාම වැදගත් කාරණයක් කියන්න මම කැමැතියි. මෙතැන අද විවාද කරන්නේ ක්‍රියා පටිපාටිය පිළිබඳවයි. ඔය විවාදය තමයි කාරක සභාව පටන් ගත් දවසේ ඉඳන්ම කෙරුණේ. අග විනිසුරුතුමිය එතුමියගේ නීතිඥ මහත්මයාත් එක්ක ආව වෙලාවේ ඉඳන් වුණේත් ඕකයි. ක්‍රියා පටිපාටිය ඇහුවා; ස්ථාවර නියෝග නීතියක් ද, නැද්ද කියා ඇහුවා; කාලය සති හයක් දෙන්න කිව්වා. පාර්ලිමේන්තුවෙන් අපට දීලා තිබෙන්නේ සති හතරයි. එතුමිය ආව වෙලාවේම සති හයක් ඉල්ලුවා. සති හතරකට සීමා කරලා තිබෙන කාරක සභාවක් සති හයක් දෙන්නේ නැහැ කියා එතුමිය දන්නවා. සති දෙකක් දුන්නා; තුනක් දුන්නා. එහෙම දීලා ලිඛිත විත්ති වාචකය ගෙනාවා. මේක සාකච්ඡා කළා. සාක්ෂි හැටියට ලේඛන ගෙනාවා. එතුමිය ලේඛන ගැන අවිශ්වාසයක් මතු කළොත් සාක්ෂිකරුවන් කැඳවන්න සූදානම් කියා කිව්වා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එහෙම කිව්වේ නැහැ. එහෙම කිව්වේ කවුද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මේ ඔක්කෝටම සූදානම් වෙලා විරුද්ධ පක්ෂයත් එක්ක දෙසැම්බර් 12 වන දා වන කල් මේ කාරක සභාව රැස් වන්න තීන්දු කළා. තමුන්නාන්සේලා ක්‍රියා පටිපාටි ගැන කථා කරනවා. අපි

[ගරු විමල් වීරවංශ මහතා]

ගෝල්ඩන් කී නඩුව -ගෙයක් නංගීට ලබා ගැනීම වෙනුවෙන් තැන්පතුකරුවන් 9,000ක් පාවා දීලා, තැන්පතුකරුවන්ට සියයට 65 දක්වා මුදල් ලැබෙන ක්‍රමෝපාය හදලා දීලා තිබුණු නඩුව ඒ මාර්ගයෙන් ඉවතට ඇදලා දමලා- සිසිලියාටයි, සෙලින්කෝ මුදලාලිටයි ඕනෑ කරන විධියට හදලා දීපු එක නීතියේ යුක්තිය පසිඳලීම කියලායි මෙතුමන්ලා කියන්නේ. එතුමියගේ ඔළුවේ තිබෙන බලය බෙදීමේ මූල ධර්මයට අනුකූලව, අන්න අර මන්ත්‍රීවරයා කියන තර්ක ටික පිළිගෙන, එන එන නඩුව තමන්ට ඕනෑ කරන විධියට තීරණ ගන්න එක නීතියේ යුක්තිය පසිඳලීම කියලා යි තමුන්නාන්සේලා කියන්නේ. අපි ඒකට කියන්නේ, ශිරාටියොරාරි ආඥාව කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජී.එල්. පීරිස් මැතිතුමා මෙතැන සිටිනකොට නීතිය පිළිබඳව මා මොන කෙහෙල්මලක්ද දන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒත් මේ අභියාචනාධිකරණ විනිසුරුවන්ට වඩා මම නීතිය දන්නවා කියලා දැන් මම හිතනවා.

මට දැන් එහෙම හිතන්න අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා; මට දැන් එහෙම හිතන්න සිද්ධ වෙලා තිබෙනවා. දෙයි හාමුදුරුවනේ! මේ ව්‍යවස්ථාවේ තිබෙන ස්ථාවර නියෝග කියන එක පෙනෙන්නේ නැති, ඇස් පෙනීමේ ලෙඩ තියෙන කට්ටිය නම් එතැන ඉන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්නේ අර්ථ නිරූපණ දෙද්දී මේකේ වචන-

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Wimal Weerawansa, please wind up your speech now. Your time is over.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩි පහක් දෙන්න. ඒ නිසා දැන් බොහොම පැහැදිලියි මෙතුමන්ලා මේ කරන්න හදන්නේ මොකක්ද කියන එක. අපි කියන්නේ මේකයි. කරුණාකර, තමුන්නාන්සේලා ආණ්ඩුවත් එක්ක තියෙන ගැටුම් ඕනෑ විධියකට බෙරා ගන්න. අද පාකාසෝතිලාගේ, "Groundviews" එකේ අධ්‍යක්ෂවරයා දීපු සම්මුඛ සාකච්ඡාවේ තමුන්නාන්සේලාට පැහැදිලිව පේනවා කියන්නේ මොකක්ද කියලා. එතුමිය බලහත්කාරයෙන් අයින් කරනවාය කියන තැනට ඒ ගොල්ලන් වාතාවරණය හදන්න හදනවා. එතුමිය හදන්නේ මේ පාර්ලිමේන්තුවේ නියෝගය පිළි නොගෙන, අධිකරණයේ ඊනියා නියෝගය "ශිරාටියොරාරි" ආඥාවට අනුකූලව නිකුත් වෙච්ච නියෝගය, අන්න ඒ "ශිරාටියොරාරි" ආඥාව පිළිඅරගෙන එතුමිය ඉන්නත්, මේ ව්‍යවස්ථාදායකය, -පාර්ලිමේන්තුව- මේ ව්‍යවස්ථාවට අනුකූලව ගන්න තීන්දුව, අතිගරු ජනාධිපතිතුමන් ඊට අනුකූලව ගනු ලබන තීන්දුව පිළි නොගෙන ඉන්නත්. ඊට පස්සේ තමුන්නාන්සේලා මේ මුළු පාර්ලිමේන්තුවටම, නීතියටම අභියෝගය කරලා කැලෑ නීතිය තුළින් මුළු අධිකරණ පද්ධතියම කෙලෙසලා, අධිකරණ ඉතිහාසයට කළු පැල්ලමක් එකතු කරලා, අධිකරණ ඉතිහාසය කිලිටි කරලා, අධිකරණ ඉතිහාසය ගඳ ගස්සලා, අධිකරණ ඉතිහාසය කෙලෙසන මේ අග විනිසුරුතුමියව බෙරා ගන්න පෙළ පාළියේ ඉස්සරහින් යනවා. තමුන්නාන්සේලාට පෙළ පාළි ඕනෑ නම් වෙන මාතෘකා හොයා ගන්න. අපි පෙළ පාළිවලට සෙනහ දෙන්නම්. කරුණාකර, මේ පාර්ලිමේන්තුවේ බලයට අත තියන්න දෙන්න එපා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, your time is over. Please wind up your speech now.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, මා අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේවා කොච්චර කිව්වත් මෙතුමන්ලා පිළිගන්නේ නැහැ. බෞද්ධ කථාවක මා අහලා තිබෙන කථාවක් කියන්නම්. කැස්බෑවෙක් ගොඩ බිම ඇවිදලා ඔක්කෝම විසිතුරු දේවල් බලලා ආයෙත් මුහුදට බැහැලා මාළුන්ට කිව්වාලු, "ගොඩ බිම කියලා එකක් තිබෙනවා. ගස් ගල් කියලා ජාති තිබෙනවා. මිනිස්සු ඇවිදිනවා" කියලා. මාළුවාට කොච්චර කැස්බෑවා මේක තේරුම් කරන්න ගියත් මාළුවට තේරුණේ නැතිලු. ගොඩ බිම කියන එක තේරුණෙත් නැහැ; ඇවිදීම කියන එක තේරුණෙත් නැහැ. මාළුවාගේ විෂය මූලික ලෝකය ඇතුළේ එහෙම සංකල්පයක් පේන තෙක් මානයක නැහැ. මෙතුමන්ලාගේ විෂය මූලික ලෝකයත් ඒ තරම් පටු ලෝකයක්. එවැනි පටු ලෝකයක ගිලිලා ඒ පටු ලෝකය තුළ ඉඳගෙන තවත් බලනවා සුද්දාට කියලා පොල්ල ගහගෙන හෝ ඇමෙරිකන්කාරයට කියලා පොල්ල ගහගෙන හෝ, UN එකට කියලා පොලු පහරක් ආණ්ඩුවට ගහ ගෙන හෝ කොහොමින් හෝ 2014, 2015 වන කොටවත් ආණ්ඩුවක් ඇති කර ගන්න පුළුවන් නම් අපට ඒ ඇති කියලා. පාර්ලිමේන්තු බලය යකාට ගියාවේ; ව්‍යවස්ථාදායකයට ඕනෑ එකක් වුණාවේ; අපට ඕනෑ වෙන මොනවත් නොවෙයි, බලය පමණි කියලයි එතුමන්ලා හිතන්නේ. හැබැයි ඉතාම ඕනෑකමින් කියන්න කැමැතියි ඔහොම ගියොත් හම්බ වෙන්නේ බලය නොවෙයි අලය කියන එක.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you very much. The next speaker is the Hon. John Amaratunga.

[අ.භා.4.58]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,- [ඝෝෂා කිරීම්] මම දැන ගෙන හිටියේ නැහැ, මට මෙච්චර භයයි කියලා මේ ආණ්ඩුවේ ඉන්න මැති-ඇමතිවරු. මම කනගාටු වෙනවා ඒ ගැන. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න. කරුණාකර, වාඩි වෙන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මහ වැස්සක් වැහැලා පැවිවා වාගෙයි අපේ ගරු විමල් වීරවංශ මැතිතුමා කථා කරලා වාඩි වුණාම. මම සන්තෝෂ වනවා, එතුමා නීතිය පිළිබඳව මොනවත් දන්නේ නැහැ කියලා පිළිගත්ත එක ගැන. එහෙම කෙනකු තමයි කමිටුවට පත් කර තිබුණේ. අපි කනගාටු වෙනවා ඒ ගැන. කෙසේ වෙතත්, මේ විවාදය -